# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2483/13 - 2026 අප්‍රේල් මස 10 වැනි සිකුරාදා - 2026.04.10**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### පුත්තලම මූලික රෝහල සංවර්ධනය හා වැඩිදියුණු කිරීම සඳහා රේඛීය සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත පවරා ගැනීම

පුත්තලම මූලික රෝහල වර්තමානයේ වයඹ පළාත් සභාව මගින් පරිපාලනය කරනු ලබන අතර එය පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටා ඇත.එම රෝහල පළාතේ ඇති විශාලතම රෝහල්වලින් එකකි. මෙම රෝහල සංවර්ධනය කිරීම සඳහා පවතින ගැටළු සැලකිල්ලට ගනිමින්, රෝහල රේඛීය සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතට පවරා ගැනීමට යෝජනා කරන ලදී.

2026.03.03 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමප/26/0349/815/023 අනුව, සහ වයඹ පළාත් ආණ්ඩුකාරවරයාගේ එකඟතාවය ඇතිව, පුත්තලම මූලික රෝහල සංවර්ධනය හා වැඩිදියුණු කිරීමේ අරමුණින් රේඛීය සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් පවරා ගන්නා බව මෙයින් දැනුම් දෙනු ලැබේ. මෙම ක්‍රියාමාර්ගය මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාගේ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිරීක්ෂණ සහ නිර්දේශයන්ට යටත් වේ.

විශේෂඥ වෛද්‍ය **අනිල් ජාසිංහ,**
ලේකම්,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

2026 මාර්තු මස 31 වැනි දින,
අංක 385, "සුවසිරිපාය "
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

EOG 04 - 0054

1A - G 46601 — 28 (2026/04)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*